# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

1969 to 2029 ECHO OF HIS CALL SINCE 1969

Editor : S. SAM SELVA RAJ 16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 MAY Issue No. 06


## ශුද්ධවූ බයිබලය

**(හිතෝපදේශ 31:23-31)**

23. ඇගේ පුරුෂයා දේශයේ වැඩිමහල්ලන් සමඟ දොරටුවල ඉඳගන්නා කල සලකනු ලබන්නේය.

24. ඈ සිහින් රෙදි සාදා විකුණයි; වෙළෙන්දාට බඳපටිත් දෙන්නීය.

25. බලයත් ගෞරවයත් ඇගේ ඇඳුමිය; ඈ මතු දවස් ගැන සිනාසෙන්නීය.

26. ඈ නුවණින් යුක්තව ඇගේ මුඛය විහිදන්නීය; ඇගේ දිවෙහි කරුණාවන්ත දැනමුතුකම් තිබේ.

27. ඈ අලසකමේ කෑම නොකා ඇගේ පවුලේ කාරණා බලාගනියි.

28. ඇගේ දරුවෝ නැගිට ඈට ආශීර්වාද කරති; ඇගේ පුරුෂයාත් ඈට ප්‍රශංසාකරමින්:

29. බොහෝ දූවරු ගුණවත්කමින් හැසුරුණෝය, නුඹත් නුඹ ඔවුන් සියල්ලන්ට වඩා උතුම්යයි කියන්නේය.

30. රූපශ්‍රීය රැවටිලි සහිතය, ශෝභනකම නිෂ්ඵලය, ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය.

31. ඇගේ අත්වල ඵලයෙන් ඈට දෙන්න; ඇගේ ක්‍රියා දොරටුවලදී ඈට ප්‍රශංසා කෙරෙත්වා.

## ප්‍රිය ඔබගේ නිහඬ විඳ දරා ගැනීම දෙවියන්වහන්සේ පොරොන්දු වූ ප්‍රීතිය බවට පත්වනු ඇත.

**Your Silent Endurance Will Blossom Into God's Promised Joy!**

(සහෝදරී ඒන්ජලින්)



අපගේ ගැලවුම්කාර වූ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුවහන්සේගේ නාමයෙන්;
උන්වහන්සේගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙහි සියලුම
පවුල්වල සාමාජිකයින්ගේ සුභ පැතුම් ගෙනෙමු!

මව්වරුන්ගේ දිනය යනු තවත් එක් සැමරුමක් පමණක් නොව; නිහඬවම තම බර උසුලන දෝෂාරෝපණය නොකර විඳදරා ගන්නා සහ අන් අයගේ සිහින සැබෑ කර ගැනීම සඳහා බොහෝ විට තමන්ගේම සිහින පසෙක දැමූ කාන්තාවන්ට ගෞරවය කිරීමට සහ ඔවුන්ව හඳුනා ගැනීමට යොමු වන විශේෂ කාලයකි.

අම්මා ගැන කතා කරන විට මේ ලෝකයට දරුවන්ව බිහිකළ කාන්තාවන් ගැන පමණක් සඳහන් නොකරමි. මෙහිදී අධ්‍යාත්මික ලෙස ක්‍රියා කරන්නාවූ මව්වරුන්ට සහ වේදනාවක් ඇති වූ විටදී ඒවා උසුලන, පෝෂණයකරන ආරක්ෂා කරන සහ විශ්වාස කරන සෑම කාන්තාවකටම මම ගෞරවය කරමි. බොහෝ පවුල්වල මව්වරුන්ගේ භූමිකාව ආදරයෙන් බාර ගන්නාවූ පියවරුන්වද මම අගය කරමි.

ඔබ සැමටම ඉතාමත් ප්‍රීතිමත් හා ආශිර්වාද ලත් මව්වරුන්ගේ දිනයක් වේවා!

3 වෙනි පිටුවට ...


**Echo of His Call**

*Christian YouTube Channel!*



Every day 2 minutes message by

**Pr. S. Sam Selva Raj!**

in English, Hindi Language - 1.00 A.M.,
in Tamil & Telugu Language - 2.00 A.M.

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

ECHO OF HIS CALL - (Marching towards 60th year)
Estd. 1969



## from your dearly beloved brother...



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

"යේසුස්වහන්සේ: නැවත නැඟිටීමද ජීවනය ද මමය ...."
(යොහාන් 11:25)

ස්වාමීන් වහන්සේ තුළ ප්‍රිය ප්‍රේමවන්තයෙනි,

අපගේ ස්වාමී වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසීමිත වූ නාමයෙන් ඔබට සුබ පතමි!

පසුගිය මාසයේදී අපගේ සේවාවන් හරහා බොහෝ දෙනෙකුට උන්වහන්සේ ආශිර්වාද කරමින් පාපයෙන්, නිගතම් වලින් සහ රෝගවලින් ඔවුන්ව නිදහස් කරන ලදී. මෙම දේව සේවය සඳහා සෘජුව සහ වකුව සම්බන්ධ වූ සැම දෙනාටම ස්වාමීන් වහන්සේ ආශිර්වාද කරන සේක්වා! ස්වාමීන් වහන්සේ අපව නිර්මාණය කර ඇත්තේ උන්වහන්සේගේ මහිමය ලෝකයට හෙළිදරව් කිරීමටය.

"මා විසින් මටම උපදවාගත් ඒ සෙනග මාගේ ප්‍රශංසාව දක්වනවා ඇත." (යෙසායා 43:21) උන්වහන්සේ වෙනුවෙන් වැඩ කරන්නා වූ අයට මහත් විපාකයක් ලැබෙනු ඇත. ස්වාමීන්වහන්සේ මෙසේ පොරොන්දු වී ඇත."......නුඹ වෙනුවට මිනිසුන්ද නුඹේ ජීවිතය වෙනුවට ජනයන්ද දෙන්නෙමි." (යෙසායා 43:4)



අපගේ ප්‍රධාන සභාවේ නිවාඩු කාලීන බයිබල් පාසැල් පුහුණු වැඩසටහන.

මෙම වසරේ අප්‍රියෙල් - මැයි මාස වල තිබූ නිවාඩු කාලයේදී බයිබල් පාසැල් සේවයේ නියැලී සිටිමින් අය සඳහා නිවාඩු කාලීන බයිබල් පාසල් පුහුණු වැඩසටහනක් 2026 මාර්තු මස 19 වැනි දින අපගේ ප්‍රධාන සභාවේදී පවත්වන ලදී. විවිධ දේවස්ථාන වලින් මෙම පුහුණුවට 150 දෙනෙක් පමණ සහභාගි වූ අතර ඔවුන් මහත් ආශිර්වාදයන් ලබා ගත්තේය.

එවැනි පුහුණුවක් ප්‍රදානම් කිරීමේ ප්‍රතිඵලය ලෙස විවිධ නිකාය භේදයකින් තොරව ළමුන් සඳහා ඉන්දියාව පුරා විවිධ දේවස්ථානවල නිවාඩු කාලීන බයිබල් පාසල් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය. දේව සේවයේ මෙම ළමා දේව සේවය නියැලී සිටින දූත මණ්ඩලයේ සභාව සහ පුද්ගලයින් වෙනුවෙන් යාඥා කිරීම සහ සහායවීම සභාව සහ පුද්ගලයින් වෙනුවෙන් යාඥා කිරීම සහ සහායවීම අපගේ ප්‍රධාන යුතුකමයි. (2 තිමෝති 4:2)

නිවාඩු කාලීන බයිබල් පාසල බලවත් මෙවලමක් බවට පත් වී තිබේ. ඉන්දියාව තුළ සිටින බොහෝ අධ්‍යාපනඥයින්, කර්මාන්තකරුවන් සහ දේශපාලනඥයින් ඔවුන්ගේ ළමා අවධියේදී මෙම නිවාඩු කාලීන බයිබල් පාසල් වලට සහභාගී වී ඇත. නිවාඩු කාලීන බයිබල් පාසල් සේවයට කැපවීමෙන් ආදරයකින් සහ දැක්මකින් සේවය කරන අය නිසැකවම අපගේ ජාතියට

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

සහ ලෝකයේ අනාගතය සඳහා දේව භක්තික පරම්පරාවක් බිහි කරනු ඇත. මෙම වගකීම ඉටු නොකිරීමේ ප්‍රතිඵලය ලෙස ශුභාරංචියට විරුද්ධ සිටින විකෘති පරම්පරාවක් බිහි විය හැකිය.

අභියෝගමත් කාලවලදී ස්වාමීන් වහන්සේ අපව ශක්තිමත් කරන ලෙසත් සෑම බාධාවක් ම ජයගැනීමට අපට උපකාර කරන ලෙසත් ඔබගේ යාඥාවලදී අප ගැන යාච්ඤා කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. මුදල්මය උපකාරයන්, සේවය සඳහා කැප වූ සේවකයින්, හිතකර වූ දේශපාලන පරිසරයක් සහ උන්වහන්සේගේ විශේෂ ආලේපය හා ආශිර්වාදය සියලු සේවාවන් වලට ලැබෙන පිරිසත් අප දෙවියන් වහන්සේ දෙස බලා සිටිමු.

ස්වාමීන්වහන්සේගේ කරුණාව ඔබ සියලු දෙනා සමග වේවා! ආමෙන්.

*In Christ Jesus, your servant,*

**Pr. S. Sam Selva Raj**
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

## දෙවියන් වහන්සේ මවක් ලෙස

බයිබලයේ බොහෝවිට දෙවියන් වහන්සේ ගැන සඳහන් කරනුයේ පියෙකුගේ ප්‍රතිරූපය භාවිතා කරමිනි. කෙසේ වෙතත් ශුද්ධ ලියවිල්ල මවකගේ ප්‍රතිරූපය තුළින් දෙවියන් වහන්සේගේ මුදු මොළොක් පෝෂණය සහ අනුකම්පා සහගත ස්වභාවය හෙළිදරව් කරයි.



*මවක් තම දරුවාව සැනසන්නාක් මෙන් දෙවියන්වහන්සේ තම සෙනඟව සනසන සේක. (යෙසායා 66:13)*

*දෙවියන්වහන්සේ තම දරුවන්ව පෝෂණය කරන්නාවූ රැකබලා ගන්නා වූ සහ සැලකිලිමත්ව සිටින්නා වූ මවකගේ ප්‍රතිරූපය නිරූපණය කරයි. (යෙසායා 66:11)*

*දෙවියන්වහන්සේව තම පැටවුන් පෝෂණය කරන්නාවූ දරුණු මවකට සමාන කර ඇති අතර උන්වහන්සේගේ ආරක්ෂිත වූ ප්‍රේමයද පෙන්නුම් කරයි. (හොෂෙයා 13:8)*

*මවක් තම දරුවාව අත්හරිනු ලැබුවත් දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන්නේ; උන්වහන්සේ තම සෙනඟ කිසිදාක අමතක නොකරන බවයි. (යෙසායා 49:15)*

*කිකිළියක් තම පැටවුන්ව ඇගේ පියාපත් යටට එකතු කරගන්නාක් මෙන් දෙවියන්වහන්සේ ද තම දරුවන්ව එක් රැස් කරමින් ආරක්ෂා කිරීමට ආශා කරයි. (මතෙව් 23:37)*

මෙයින් අපට මතක් කර දෙන්නේ, දෙවියන්වහන්සේගේ ප්‍රේමයට පියෙකුගේ ශක්තිය සහ මවකුගේ මුදු මොළොක් බව යන කාරණාවන් දෙකම ඇතුළත්ව ඇති බවයි. දෙවියන්වහන්සේගේ සැලකිලිමත්කම හා පෝෂණය යන ගුණාංග ගැන අපට බොහෝ කාරණාවන් කතා කරමින් සිටිය හැකිය. එය උන්වහන්සේගේ දරුවන් කෙරෙහි උන්වහන්සේ දක්වන්නාවූ ගැඹුරු සහ දයානුකම්පිත හදවත පිළිබඳව හෙළිදරව් කරයි.

## සාරා සිනාසුණේය.

අප ශුද්ධ ලියවිල්ල දෙස බලන විටදී එහි සඳහන් සෑම මවක්ම දෙවියන් වහන්සේගේ අසාමාන්‍ය පොරොන්දුවක් අත්දැකීම ලද්දේය. එසේම සාරාද ඇගේ ජීවිතයේ සාමාන්‍ය රිද්මයකට පිවිසුනාවූ මොහොත පැමිණියේ ඇගේ කුඩාරමේ දොරටුව අසලදීය.

දේව වචනය තුළ උත්පත්ති 18:12 හි මෙය සඳහන් කරකර ඇත.

*සාරා තනියම සිනාසුනාය. ඇය සිතනු ලැබුයේ; "මම වෙහෙසට වී මගේ ස්වාමියා මහලු පසු මට දැන් මේ සතුට ලැබේවිද?" යනුවෙනි.*

දෙවියන්වහන්සේ එම මොහොත දුටුවේය.

එසේම, දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දරුවෙකු දෙන බවට පොරොන්දු වූ විටදී ආබ්‍රහම් සිනාසුණේය. උත්පත්ති 17:17 හි මෙසේ පවසයි.

*එවිට ආබ්‍රහම් මුහුණින් වැටී සිනාසී; "සියක් අවුරුදු වයස් වූ තැනැත්තෙකුට දරුවෙක් උපදින්නේද අනූ අවුරුදු වයස් වූ සාරා වදන්නීදැයි" සිත තුළ කියාගත්තේය.*

එකම පොරොන්දුව මෙම දෙදෙනාම අසා සිනාසෙනු ලැබුවත්, ඔවුන්ගේ සිනහවට දෙවියන්වහන්සේගේ ප්‍රතිචාරය වෙනස්ව තිබුණි. මෙහිදී මම සාරාගේ සිනහව කෙරෙහි අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

සාරා සිනාසුනු පසු දෙවියන්වහන්සේ ඇගෙන් ප්‍රශ්නයක් අසනු ලැබුවේය.

*"ස්වාමීන්වහන්සේට බැරි දෙයක් ඇද්ද........." (උත්පත්ති 18:14)*

මෙය මොනතරම් ගැඹුරු අනාවැකියක් සහ අසිරු ප්‍රශ්නයක්ද! එය ප්‍රශ්නයක් පමණක්ම නොව

දෙවියන්වහන්සේගේ අසීමිත බලය හා ස්වෛරී අධිකාරිය පිළිබඳ බලවත් ප්‍රකාශයකි.

**මෙහිදී අපගේ අවධානය යොමු කළ යුතු කාරණය නම්;**

- ★ සාරා සිනාසුනා
- ★ හයියෙන් නොවෙයි.
- ★ ප්‍රසිද්ධියේ නොවෙයි.
- ★ නමුත් ඇය තුළම නිහඬතාවයකිනි.

එහෙත්, දෙවියන් වහන්සේ අසා ඇත.

මෙම පණිවිඩය සෑම මවකටමය - දරුවන්ව බිහිකළ, දරුකමට හදාගත්, අධ්‍යාත්මික; බලා සිටින, ශෝක වන හෝ තවමත් විශ්වාස කරන අයටයි.

- ★ පිටතින් සිනාසෙනන නමුත් කඳුළු සඟවාගෙන ගමන් කරන අය
- ★ නිහඬවම හදවත් තුළ කලකිරීම් දරා සිටින්නා වූ අය
- ★ වයස, කාලය හෝ වේදනාව නිසා තම සිහින පසෙක දැමූ අය
- ★ නොපෙනෙන, අගය නොකළ, අමතක වූ හෝ සමහර විට ප්‍රමාද වැඩියි කියා හැඟෙන අය

දෙවියන් වහන්සේගේ ආදරණීය දරුවෙනි, ස්වාමීන් වහන්සේ මවකගේ හදවතෙහි සැඟවුණාවූ සියලු ස්ථාන ස්පර්ශ කිරීමට කිරීමට කැමති වන්නේ ඒවා හෙළිදරව් කිරීමට නොව ඒවා සුවපත් කර යථා තත්ත්වයට පත් කිරීමටයි.

## 1). මව්වරුන් නිහඬ සිහනවක් දරති!

ශුද්ධවූ බයිබලයේ උත්පත්ති 18:12 හි සඳහන් වන්නේ; ........*සාරා සිත තුළ සිනාසී*..........

මව්වරුන්, නිහඬ සිනහවේ ප්‍රවීණයෝ වෙති. අපගේ ගැඹුරු හැඟීම් අප බෙදාගනු ලබන්නේ ඉතාමත් කලාතුරකිනි. ඒ වෙනුවට අපි බොහෝ විට මෙසේ කියමු.

- ★ අප සම්පූර්ණයෙන්ම වෙහෙසට පත් වූ විට "මම හොඳින්"
- ★ අපව දැඩි ලෙස රිදවන විට "කමක් නැහැ".
- ★ අප තවමත් බලා සිටින විට "මම ඉදිරියට ගියා"
- ★ "මට තවදුරටත් එය අවශ්‍ය නැහැ" අපේ හදවත් තවමත් ඒ සඳහා ආශා කරන විට

කාන්තාවන්ව තේරුම් ගැනීමට ඉතා අපහසු බව මිනිසුන් බොහෝවිට පවසන්නේ ඒ නිසා විය හැකිය. මෙන්න අපි එය දකිමු;

**සාරාගේ සිනහව සිනහවක් විය,**

- ★ බලාපොරොත්තු කඩ කරයි
- ★ ප්‍රමාදය
- ★ වේදනාව
- ★ ස්වයං ආරක්ෂාව

අපගේ සිනහව ශෝකයෙන් හා අසෘප්තියේ සංකේතවලින් හැඩ ගැසී තිබුණි. නින්දා සහගත ඇස් සිදුණු හා චෝදනා කරන වචන සහ ඇයව ශාපයක් ලෙස ලේබල් කරමින් ඇය සිටි තත්ත්වය "අධ්‍යාත්මික" කිරීමට නිරන්තරයෙන් උත්සාහ දැරුවේය. වසර ගණනාවක් පුරාම ඇගේ හදවත සෙමෙන් දැඩිකර ඇත.

ඇය මතු දිනෙක මවක් වන්නට යන බවට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව අවසානයේදී ඇය ඇසූ විට - එය සැමරීමට ඇ තුල කිසිවක් ඉතිරිව තිබුණාය කියා මා විශ්වාස නොකරමි.

අප බොහෝ දෙනෙක් මව්වරුන් පමණක් නොවේය. අප මෙලෙස නිහඬ ආකාරයෙන් සිනහවෙන් අප දෙවියන්වහන්සේව සැක කරන නිසා නොව අපගේ හදවත ආරක්ෂා කරන නිසාය.

එහෙත් දෙවියන්වහන්සේ එම සිනහවෙන් ඇසූ සුන්දර සතය මෙයයි.

මෙය සිදුවන විට සාරා කූඩාරම තුළ සිටියාය. ඇගේ සිනහව සැඟවී තිබුණි. එය මිනිස් ඇස් වලට නොපෙනුන නමුත් දෙවියන්වහන්සේ තවමත් එය දුටු අතර එය ඇසුවේය. අපගේ ජීවිතයෙහි එවැනි අවස්ථාවන්ට අප මුහුණ දෙන විට උන්වහන්සේ එසේ කරන්නේ අපව ලැජ්ජාවට පත් කිරීමට නොව අපව සුවපත් කිරීමටයි.

## 2). දෙවියන්වහන්සේ මවකගේ සැකයට අභියෝග කරයි!

ආබ්‍රහම්ගේ සිනහව සහ සාරාගේ සිනහව අතර කැපී පෙනෙන වෙනසක් තිබේ. ආබ්‍රහම් සිනාසෙනු ලැබුවේ; පුදුමයෙන් සහ ලැබුණු ආරංචිය නිසා ප්‍රීතියෙන් පිරී ඉතිරී ගිය බැවින්ය. නමුත් සාරා සිනාසෙනු ලැබුවේ; වේදනාවෙන් සහ කලකිරීමෙන් යුතුවය.

"සාරා සිනාසුනේ ඇයි?" කියා දෙවියන් වහන්සේ සාරාගෙන් ඇසුවේ ඇයි? සාරා සිනාසනු කාරණය ගැන දෙවියන්වහන්සේ දැනගෙන සිටියේ නැත, කියා ඔබ

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

අපගේ ලිපිනය:

**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: [illegible]@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපැලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES

SINCE 1960

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි:19 -** අපගේ සේවකයින් ඔවුන්ගේ සේවය උදෙසා කරන්නා වූ ගැඹුරු කැපවීම නිසා නිසා හා ඔවුන්ගේ පවුල්වලට උන්වහන්සේ අධික ලෙස ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**මැයි:20-** කලහකාරී තත්ත්වයන් සහ යුද්ධය මධ්‍යයේ සියලු ජාතීන්ට දිව්‍ය ආරක්ෂාව ලබා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**මැයි:21 -** දේශපාලනික හා ආගමික විරුද්ධතා මධ්‍යයේ වුවද අපගේ කිතුනු සේවකයින්ගේ වර්ධනය සහ නොපසුබට උත්සාහය නිසා, ස්තුති කරන්න.

**මැයි:22-** සෑම ක්ෂේත්‍රයක් තුළම සිටින සාක්ෂිකරුවන් නගා සිටුවීම සහ ඔවුන්ව බලගැන්වීම සිදු කරන නිසා, ස්තුති කරන්න.

**මැයි:23 -** අපගේ අනර්ඝ මුද්‍රණ යන්ත්‍රයේ අඛණ්ඩ හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්ව හා එම මුද්‍රණ සේවයටයි කැප වූ සේවකයින් නිසා, ස්තුති කරන්න.

**මැයි:24-** අපගේ නේවාසික සහ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යාලයට සම්බන්ධ වූ නවක සිසුන් නිසා හා විද්‍යාලෙහි කාර්ය මණ්ඩලයේ සිටින සියලු දෙනාටම ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:25-** අපගේ ප්‍රධාන සභාවේ සහ එහි ශාඛාවන් වල ඉරුදින පවත්වන සේවාවන් වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:26-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල සියලුම සමාජිකයින්ට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:27-** අපගේ ප්‍රධාන දේවගැති තුමා වන සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාවම සියලු නපුරෙන් ආරක්ෂා කර තිබෙන නිසා ස්තුති කරන්න

**මැයි:28-** 2025 - 2026 මූල්‍ය වර්ෂය සඳහා දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා දුන් නිසා ස්තුති කරන්න

**මැයි:29 -** අපගේ යාච්ඤා හවුල්කරුවන්ට, දායක හවුල්කරුවන්ට, ඇදහිල්ලේ හවුල්කරුවන්ට, ජීවිත කාලය පුරා හවුල්කරුවන්ට සහ මහා ආඥාවේ හවුල්කරුවන්ටත් ඔවුන්ගේ පවුල්වලටත් දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:30-** අපගේ ප්‍රධාන සභාව විසින් පවත්වනු ලැබූ සියලුම නිවාඩු කාලීන බයිබල් පාසල් වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:31-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ 2026 - 2027 වන අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට උන්වහන්සෙ ආශිර්වාද කළ නිසා සහ පාසලේ දහවන ශ්‍රේණියේ සිසුන්ට විශිෂ්ට ප්‍රතිඵල ලබාදී ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූනි:01-** ශ්‍රී ලංකා දේශයට දෙවියන් වහන්සේ ලබා දී තිබෙන සමාදානය සහ රටේ නායකයින්ට දී තිබෙන අනුග්‍රහය නිසා ස්තුති කරන්න.

**ජූනි:02-** ශ්‍රී ලංකා දේශය තුළ තිබෙන කිතුණු සභාවට සුභාරංචිය ප්‍රකාශකිරීමට සියලු බාධාවන් වලින් තොරව දොරවල් විවෘත කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූනි:03-** ශ්‍රී ලංකා දේශය තුළ සිටින දේව දාස දාසීන් සහ දෙවියන් වහන්සේගේ සෙනඟට ලබා දී තිබෙන රැකවරණය හා සැපයීම නිසා යාච්ඤා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි:04-** අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ස්වාමීන්වහන්සේගේ ආශිර්වාදය දිගටම ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:05-** අපගේ සියලුම සේවාවන් සෑම ආකාරයකින්ම පුළුල් වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:06-** යාච්ඤාවෙන් හා මූල්‍යමය සහයෝගයෙන් අපගේ සියලුම සේවාවන් පවත්වාගෙන යන පිණිස අපට උපකාර කරන්නා වූ සියලු දෙනාත් අපට සුභ පතන්නන් හා සියලුම මිතුරින් නිසා යාච්ඤා කරන්න.

**ජූනි:07-** 2ලොව පුරා සිටින්නාවූ සියලුම ජනාධිපතිවරුන් අගමැතිවරුන් සහ සියලුම රාජ්‍ය නායකයින් උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:08-** ඇමෙරිකා එක්සත් ජනපදය, ඊශ්‍රායලය හා ඉරානය යන රටවල් වල පවතින යුද ගැටුම් වලින් පීඩාවට පත්ව සිටින සියලුම ජාතීන්ට ඔවුන්ගේ යටිතල පහසුකම් නැවත ගොඩනගා ගනිමින් ඉතා ඉක්මනින් යථා තත්ත්වයට පත්වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:09-** ලොව පුරා පවත්වනු ලබන නිවාඩු කාලීන බයිබල් පාසල් වලට සහභාගී වූ දරුවන් ඔවුන්ගේ ඇදහිල්ල තුළ ස්ථිරව වර්ධනය වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:10-** දීර්ඝව පවතින සියලු යුද්ධයන් අවසන් වී ලොව පුරා සාමය පැතිරෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:11 -** 2026 - 2027 යන අධ්‍යයන වර්ෂය සඳහා ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නවක සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස සහ අපගේ නේවාසික සහ සන්ධ්‍යා කාලයේ පවත්වනු ලබන නෙහෙමියා බයිබල් විද්‍යාලයට සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:12-** අපගේ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සෞඛ්‍යයක් ලැබෙන පිණිස සහ අපගේ විවිධ සේවාවන් හරහා ළඟා නොවූ ස්ථානවල සුභාරංචිය පතුරවා හැරීමට අපට හැකියාව ලැබෙනු පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:13 -** සියලුම කිතුනු සංවිධාන කෙරෙහි දෙවියන්වහන්සේගේ ආශිර්වාදය හා ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:14-** දෙවියන්වහන්සේගේ රාජ්‍ය පොළොව මත ගොඩනැගීම සඳහා වඩා හොඳ දැක්මක් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:15--** ලොව පුරා සිටින තරුණ තරුණියන් සහ දරුවන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේව ඔවුන්ගේ පුද්ගලික ගැලවුම්කරු ලෙස පිළිගන්නා පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:16--** අපගේ ජ්‍යෙෂ්ඨ දේව ගැති එස්. සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාවම යහපත් ආරක්ෂාව සහ මග පෙන්වීමක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:17--** ශ්‍රී ලංකා දේශය තුළ කිතුනුවන්ට මුලා කරන වැරදි ඉගැන්වීම් වලින් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**ජූනි:18--** ශ්‍රී ලංකා දේශය තුළ දරුවන් සහ තරුණ තරුණියන්ව මත්පැන්, මත්ද්‍රව්‍ය, සමාජ මාධ්‍ය හරහා අයහපත් දේවල් තුළින් ආරක්ෂා කර කරන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

සිතනවාද? එසේම ඇගේ වේදනාව උන්වහන්සේ තේරුම් ගත්තේ නැත කියා ඔබ සිතනවා ද?

අලුත් ගිවිසුමේදී පවා යේසුස්ක්‍රිස්තුස් වහන්සේ සුව කිරීමට පෙර මෙසේ පවසනු ලැබුවේය. උන්වහන්සේ ඒ හා සමානවම ප්‍රශ්න කරනු ලැබුවේය. මාර්ක් 18:51හි උන්වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසුවේය. එනම්; *''මා ඔබට කුමක් කරනවාට ඔබ කැමතිද?''* යනුවෙනි. එම අන්ධ මිනිසා පිළිතුරු දුන්නේ ''රබ්බී, මට මගේ පෙනීම නැවත දෙන්න'' කියාය. ඔහුට තවත් කුමක් ඉල්ලා සිටිය හැකිද?

දෙවියන්වහන්සේ අපගෙන්ද එවැනි ප්‍රශ්න අසන්නේ උන්වහන්සේ ඒවා නොදන්නා නිසා නොව සාරා මෙන් අපගේ හදවත් තුළ අවිශ්වාසය නිහඬව තැන්පත් වී ඇත්තේ කවදාද කෙසේද කියා අපට නොතේරෙන බැවිනි.

*දෙවියන්වහන්සේ වහාම සාරාට මුහුණ දුන්නේය.*

*සාරා සිනාසෙමින් මෙසේ පැවසුවේ ඇයි? ''මහලු වූ මම සැබවින්ම දරුවෙකු වදන්නෙම් දැයි කියමින් සාරා සිනාසුණේ මක්නිසාද?'' (උත්පත්ති 18:13)*

උන්වහන්සේගේ තරවටුව දඬුවමක් නොවේය - එය පුනර්ජීවනයකි. සමහර විටදී දෙවියන්වහන්සේ මවකගේ ඇදහිල්ල නැවත ඇතිකිරීම සඳහා ඇයට පැමිණෙන්නා වූ දේවලට මුහුණ දිය යුතුය.

ප්‍රිය මිතවරුනි, දෙවියන් වහන්සේ අප වෙනුවෙන් මුහුණ දෙන්නේ :

- ★ අප තවමත් යාච්ඤා කරන දරුවා
- ★ අප බලාපොරොත්තු වීම අත්හැරියා වූ පොරොන්දුව
- ★ අප විශ්වාස කිරීම නැවැත්තුවා වූ අනාගතාවය
- ★ අප නිහඬව අත්හැර දැමූ අනාගතය
- ★ අපට අහිමි වූ සිහින

ඔහු වසා දමා තිබූ ගර්භාෂය අවදි කරමින් සිටියේය.

ඔහු හිරිවැටී තිබූ ඇදහිල්ලත් නැවත පණ ගන්වමින් සිටියේය.

## 03). දෙවියන් වහන්සේගේ වචනය ඕනෑම තැනක සිටින මවක්ව සොයා ගනී!

අපි කොහේ සිටියත් දෙවියන් වහන්සේ අපිව දකින අතර මට උන්වහන්සේ ආදරෙයි. ආබ්‍රහම් කූඩාරමෙන් පිටත සිටිය අතර සාරා එහි ඇතුළත සිටියේය. නමුත් දෙවියන්වහන්සේ එම ස්ථානවලදීම ඔවුන්ට කතා කරනු ලැබුවේය.

එලෙසම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අත්තික්කා ගස යට සිටි පිලිප්ව දුටුවේය.

දෙවියන්වහන්සේ සාරාට කූඩාරමෙන් එළියට එන්න කියා කතා කළේය නැත.

ඇය සිටි ස්ථානයේදීම උන්වහන්සේ ඇයට කතා කළේය. ආමෙන්! අපි කොහේ සිටියත් දෙවියන්වහන්සේ අපට කතා කරයි.

අද අපෙන් බොහෝ දෙනෙක් සැඟවී සිටිති. ර කියාවෙන් යටපත් වී, නිරන්තරයෙන් යමෙකු රැකබලා ගනිමින් සහ නිහඬව අපගේ වගකීම් ඉටු කරමින් සිටිති.

**දෙවියන් වහන්සේ මව්වරුන්ට කතා කරයි.**

- ★ මුළුතැන් ගෙය තුළ
- ★ කාරය ඇතුළත
- ★ රැකියා කරන ස්ථානය තුළ
- ★ යාච්ඤා කරන ස්ථාන තුළ
- ★ රෝහල් කාමර වල
- ★ මැදියම් රාත්‍රියේ කඳුළු අතර
- ★ නිහඬ සටන්වලදී
- ★ බිඳුණු සිහින මධ්‍යයේ

දෙවියන්වහන්සේගේ ආදරණීය දරුවෙනි, ඔබ කොතැනක සිටියත් උන්වහන්සේ ඔබව දකින බවට බලාපොරොත්තුව නැති කර නොගන්න. ඔබ ඔබේ පවුලේ අයගෙන්, මිතුරන්ගෙන් හෝ ලෝකයෙන් පවා සැඟවී සිටින්නට පුළුවන් නමුත් ඔබට දෙවියන්වහන්සේගෙන් සැඟවී සිටීමට නොහැකිය. උන්වහන්සේ ඔබ දෙස බලා සිටින සේක. දෙවියන්වහන්සේ මවක් ලෙස, මුදු මොලොක් සැලකිල්ලකින් අපව බලා ගන්නේය.

## 4). පොරොන්දුව පැමිණීමට පෙර දෙවියන්වහන්සේ මවකගේ හදවත ප්‍රතිෂ්ඨාපනය කරයි.

සාරාගේ හදව තුළ විශ්වාසය පිළිසිඳ ගත යුතුව තිබුණි.



***Faith had to be conceived in Sarah's heart***

ඊසාක් සාරාගේ කුස තුළ පිළිසිඳ ගැනීමට පෙර ඇගේ හදවතෙහි ඇදහිල්ල පිළිසිඳ ගත යුතුව තිබුණි. සාරා දෙවියන්වහන්සේගේ මනුෂ්‍ය වර්ගයාට දුන් ශ්‍රේෂ්ඨතම පොරොන්දුව රැගෙන යාමට ආසන්නව සිටියාය. මෙය සිදුවීමට පෙර දෙවියන් වහන්සේට ඇය තුළ කාර්යයක් කිරීමට සිදුවිය.

දෙවියන්වහන්සේ ඇයගෙන් මෙසේ ඇසුවේය; ''ස්වාමීන් වහන්සේට අපහසු දෙයක් තිබේද ?''

මෙය හැකියාව පිළිබඳ ප්‍රශ්නයක් නොවේය. පෙළගැස්ම පිළිබඳ ප්‍රකාශයක් විය.

**දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක;**

- ★ අම්මේ මට ඔබේ හදවත සුවපත්කිරීමට අවශ්‍යයි.
- ★ මට ඔබේ බලාපොරොත්තුව යථා තත්ත්වයට උපත් කළ යුතුයි.
- ★ මට ඔබේ විශ්වාසය අවදි කළ යුතුයි.
- ★ මට ඔබේ ආත්මය නැවත පිවිතුරු කළ යුතුයි.

★ මට කළ නොහැකි දේ කළ හැකි බව විශ්වාස කිරීමට පටන් ගැනීමට මම කැමැත්තෙමි.

දෙවියන්වහන්සේගේ ආදරණීය දරුවෙනි, අප තවදුරටත් විශ්වාස නොකරන දෙයක් අපට බිහිකළ නොහැකියි.

දෙවියන්වහන්සේ කතා කරනු ලබන්නේ, බලාපොරොත්තු සුන් වී නැවත නැවතත් දිගුකල් පවතින වේදනාවන් නිසා හිරි වැටුණු අපගේ සමහරුන්ටය. අප උන්වහන්සේගේ සැලැස්මට කීකරු වෙන තෙක්, උන්වහන්සේ බලා සිටින බවට මම ඔබව දිරිගැන්වීමට කැමැත්තෙමි. අපගේ දැක්ම දෙවියන් වහන්සේගේ දැක්ම සමග එකග නොමැති නම්, උන්වහන්සේ අපගේ ජීවිතය තුළ කිරීමට අදහස් කරන දේ ඉටු කළ නොහැකිය.

දෙවියන්වහන්සේ දැන් අපගේ ජීවිතවල ක්‍රියාකරමින් සිටියි. උන්වහන්සේගේ පොරොන්දුව ඉටුවන තෙක් බලා සිටින විටදී අධෛර්යයට පත්වීමට හෝ දෙවියන්වහන්සේ ව සැකකිරීමට වඩා අප අපවම නැවතත් පරීක්ෂා කළ බලා අපගේ ජීවිතය උන්වහන්සේගේ කැමැත්තට අනුකූලව හැඩ ගසා ගත යුතුය.

## 5). දෙවියන් වහන්සේ මවකගේ සැකය ඇගේ ඉරණම බවට පත්කරයි.

මෙම මාසයේදී දෙවියන්වහන්සේ අපගේ සැකයන් අපගේ ඉරණම බවට පත්කරන ලෙස මම යාච්ඤා කරමි. සාරා වරක් දෙවියන් වහන්සේගේ පොරොන්දුව සැක කළාය. නමුත් දෙවියන් වහන්සේ නියමිත වේලාවට සියල්ල වෙනස් කළේය. ඔබගේ ජීවිතයේත් නියමිත කාලයේ උන්වහන්සේගේ පොරොන්දු වේවා කියා මා යාච්ඤා කරමි.

*"...... දෙවියන්වහන්සේ මා සිනාසෙන්ට සැලැස්වූ සේක: ඒ අසන සියල්ලන් මා සමග සිනාසෙනවා ඇතැයි සාරා කීවාය." (උත්පත්ති 21:6)*

★ වරක් සැකයෙන් සිනාසුනු එම කාන්තාව දැන් දෙවිය ඉදිරියෙහි සිනාසෙයි.

★ අවිශ්වාසයෙන් කතා කළ එම මුඛයෙන්ම දැන් සාක්ෂියක් ප්‍රකාශ කරයි.

★ වඳව තිබූ එම ගර්භාෂය දැන් පොරොන්දුව පිළිසිඳ ගනියි.

දෙවියන්වහන්සේ හැරී:

★ ඇගේ වේදනාව සතුටටත්

★ ඇගේ සැකය ඇදහිල්ලටත්



★ ඇගේ නිහඬතාවය සැමරීමකටත්

★ ඇගේ සැගවුණු සිනහව සියල්ලන් ඉදිරියෙහි සාක්ෂියක් බවට පත්විය.

දෙවියන්වහන්සේ ඔබ හා මා වෙනුවෙන් ඉටුකරන්නේ මෙයයි.

දෙවියන්වහන්සේ මව්වරුන්ගේ ජීවිත තුළට ඇතුල් වූ විට අසාමාන්‍ය දේවල් සිදුවිය. එවැනි සාක්ෂි කීපයක් පහත සඳහන් කර ඇත.

**මරියා,**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මව -

ගැලවුම්කරුවෙකුගේ පොරොන්දුව

**සම්සොන් මව -**

ගැලවුම්කරුවෙකුගේ පොරොන්දුව

**එලිසබෙත් (යොහාන් භෞතිස්තගේ මව) -**

නැවත අලුත් කිරීමේ පොරොන්දුව

**සාරා (ඊසාක්ගේ මව)-**

නව උරුමයක් පිළිබඳ පොරොන්දුව

මිතුවරුනි, දෙවියන්වහන්සේ ඔවුන්ගේ ජීවිතවල බාධා ඇති කරමින් අවුල් සහගත තත්ත්වයන් හා

....Contd. to page 10

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### ''...කියවන්නා තේරුම් ගනීවා....'' *(මතෙව් 24:15)*

''....... ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නා ද වාසනාවන්තයෙක්ය.'' (හිතෝපදේශ 16:20)

මගේ දේව සේවයේ මුල් වසර වලින් පසු, විදේශ රටවල වෙසෙන කිතුනු දේව සේවකයන් ජිවත් වූ ආකාරය, ඔවුන්ගේ අධ්‍යාත්මික ජීවිතය පෝෂණය කරගත් ආකාරය සහ ඔවුන්ගේ දේව සේවය ඉටුකළ ආකාරය තේරුම් ගැනීමට මට ගැඹුරු ආශාවක් ඇති විය. නමුත් ඒ දින වලදී මට මූල්‍ය සම්පත්, මනුෂ්‍ය සහයෝගය සහ මගේම අධ්‍යාත්මික හැකියාවන් කෙරෙහි විශ්වාසය තැබීමට මා හට අසීරුවිය.

මටම පුදුමයක් ගෙන දෙමින් 1989 වන වසරේදී මගේ දින පොතේ මා සැලසුම් සටහන් කරන අතරතුර අගෝස්තු මස මැලේසියාවට යන බව මා එහි සටහන් කොට තිබුණි. වැඩි කල් නොගොස් මාස තුනකට ආසන්න කාලයක් මම ඒ ගැන සම්පූර්ණයෙන්ම අමතක කළෙමි. නමුත් එක් දිනක් මම නැවත මගේ දිනපොත දෙස බැලූ විට මා ලියා තැබූ එම දිනය වේගයෙන් ළඟා වෙන බව මට වැටහුණි. එවිට මම ඉතා කැළඹීමට පත් වී සිටි අතර ඒ සඳහා මා කුමක් කළ යුතුදැයි නොදැන සිටියෙමි. එබැවින් මම යාච්ඤාවෙන් ඒ කාරණය ස්වාමින් වහන්සේට භාර දුන්නෙමි.

''නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුති දීම සමඟ යාච්ඤාවෙන්ද කන්නලවෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්නවාපල්ලා.'' (පිලිප්පි 4:6)

දිනෙන් දින ගෙවී ගිය නමුත් කිසිවක් සිදු වුණේ නැත. විදේශගත වී සේවය කිරීමට මට සුදුසුකමක් නොමැති බව මම හොඳින් දැනුත් දෙවියන් වහන්සේ කෙරෙහි මගේ විශ්වාසය මා නැති කර ගත්තේ නැත.

ඒ කාලය තුළ දෙවියන්වහන්සේගේ වචනය දේශනා කිරීම සඳහා මැලේසියාව වැනි රටවල නිතර සංචාරය කරන සහෝදරයෙකු හමුවීමට මට අවස්ථාවක් ලැබුණි. විදේශගත වීමට මගේ ආශාව මම ඔහු සමග බෙදා ගත්තෙමි. මේ සඳහා වැඩිදුර මග පෙන්වීම ලබා ගැනීමට චෙන්නායිහි ඔහුගේ නිවසට පැමිණෙන ලෙස ඔහු මට උපදෙස් දුන්නේය. ඒ අනුව එක් උදෑසනක මම ඔහුව හමුවීමට බොහෝ දුරක් ගමන් කළෙමි. කෙසේ වෙතත් ඔහු කාර්ය බහුල බව මට පැවසූ අතර නැවත සඳුදා දින පැමිණෙන්න කියා ඔහු මගෙන් ඉල්ලා සිටියේය. මම නැවත එහි ගිය විට ඔහු මගෙන් වෙනත් දිනයක පැමිණෙන ලෙස ඉල්ලා සිටියේය. මාසයකට ආසන්න කාලයක් මෙලෙස ගෙවී ගිය අතර මට සැලකිය යුතු කාලයක් සහ මුදල්ද නැති විය. අවසානයේ ඔහු මට උදව් කිරීමට අකමැති බව මට වැටහුණේය.

පසුව ඔහු මට කෙලින්ම මෙසේ පැවසුවේය; ''ඔබට මැලේසියාවට යාමට බැහැ මන්ද මා වැනි දක්ෂ පුද්ගලයන්ට පමණයි එවැනි ස්ථාන වලට යන්න පුළුවන්, එම රටවල් වලදී ඔබව කවුරුත් පිළිගන්නේ නැහැ. නැවත මා ළඟට එන්න එපා'' යනුවෙනි.

මෙම අධෛර්යය වීම් මධ්‍යයෙහි වුවද මා මගේ බලාපොරොත්තුව නැතිකර නොගෙන දිගටම යාච්ඤා කළ අතර දෙවියන් වහන්සේගේ කැමැත්ත එළිදරව් වන තෙක් ඉවසිල්ලෙන් බලා සිටියෙමි.

සති දෙකකට පසු මගේ කාර්යාලයේ ලිපි පරීක්ෂා කරමින් සිටියදී මැලේසියාවෙන් මා වෙතට එවා තිබූ එක් ලිපියක් හමුවිය. එහි සේවය කරමින් සිටි නැසීගිය දේව රාජ් ලූ දේව ගැතිවරයාගෙන් මට එම ලිපිය ලැබී තිබුණි. එම ලිපියෙහි මෙසේ සඳහන්ව විය.

ක්‍රිස්තුස්වහන්සේ තුළ මගේ ආදරණීය සහෝදර සෑම් සෙල්ව රාජ්,

මම පොත් වලට බොහෝ කැමතියි. අද මා පැරණි පොත් විකුණනේ කඩයකට ගියෙමි. එහිදී මා ප්‍රයෝජනවත් දෙයක් සොයමින් සිටියදී ''කැඳවීමේ ප්‍රතිරාවය''යන ඔබගේ සඟරාවේ ඉරා දැමූ පිටපතක් මට හමුවිය. මම එය කියවීමට පටන් ගත් විට ස්වාමින්වහන්සේ මට කෙලින්ම කතා කළ බව දැනුණි.

කරුණාකර ඔබගේ පෙර කලාප ද මා වෙත එවන්න. එයට වැය වන තැපැල් වියදම්ද මා දරමි. එසේම ඔබව පෞද්ගලිකව හමුවීමටද මා කැමැත්තෙමි. මැලේසියාවේදී ඔබගේ ගමන් පහසුකම්, ආහාර පාන සහ නවාතැන් පහසුකම් යන සියල්ලම සූදානම් කිරීමට මා කැමැත්තෙමි.

තවද සිංගප්පූරුවේ සහ ඉන්දුනීසියාවේ සේවය කිරීමට අවශ්‍ය කටයුතු මා විසින් සූදානම් කරමි. අපට ඔබ වැනි දෙවියන් වහන්සේගේ දේව සේවකයින් අවශ්‍යයි. කරුණාකර හැකි ඉක්මනින් මෙයට පිළිතුරක් දෙන්න.

ආදරණීය, දේවගැති දේවරාජ්ලූ

මා මගේ දින පොතෙහි ලියා තිබූ ආකාරයටම 1989 වන වසරේ අගෝස්තු මාසයේදී නැසී ගිය දේවරාජ්ලූ දේව ගැති තුමාගේ ආරාධනය පරිදි මා හට මැලේසියාවට යාමට හැකි විය. එතැන් සිට මම සිංගප්පූරුවට සහ ඉන්දුනීසියාවටද ගිය අතර එහිදී මා සිය ගණන් ජනතාවට පාපය, ශාපය සහ දිළිඳුකම යන සියල්ලම, ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිරිනමන ගැලවීම තුළින් නිදහස් වීමට හැකි බව දේශනා කළෙමි. එම රටවල සිටි බොහෝ දේව සේවකයින් සමගින් දිගුකල් පවතින මිතුත්වයක් ගොඩනගා ගැනීමට ද ස්වාමින් වහන්සේගේ කරුණාවෙන් මට හැකියාව ලැබුණි. අද දක්වාම එම මිතුත්වය අප අතර පවතී.

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

දෙවියන්වහන්සේගේ බහුල කරුණාවෙන් දකුණු අප්‍රිකාව, ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, ස්කොට්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ස්විස්ර්ලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ දකුණු කොරියාව වැනි රටවල් තුළ සිටින ජාතීන් වෙතට යාමට ස්වාමීන්වහන්සේ දොරටු විවෘත කළ අතර දහස් ගණන් සෙනගට උන්වහන්සේගේ වචනය දේශනා කිරීමේ වරප්‍රසාදයද මට ලැබී තිබුණි.

අද මට බොහෝ රටවල් වලින් ආරාධනා ලැබී තිබේ. දෙවියන් වහන්සේ මට කොතරම් ආශිර්වාද කර තිබේද? මන්ද එම සියල්ල පිළිගැනීමට නොහැකි තරම් මා හට කාලය අධික වැඩ නිසා සීමා වී තිබේ.

මෙය කියවන්නා වූ ප්‍රේමවන්ත පාඨකයෙනි, මා ප්‍රකාශ කරන ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබෑ වූ දෙවියන්වහන්සේමය. උන්වහන්සේ සැබෑ වූ මාර්ගය, සත්‍ය සහ ජීවනයයි. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න. උන්වහන්සේ වෙතට පැමිණෙන්න. උන්වහන්සේගේ සේවයට කැපවන්න. උන්වහන්සේ ඔබට පුදුමාකාර මාර්ගය තුළින් මග පෙන්වන අතර ඔබේ ජීවිතයට බහුල ලෙස ආශිර්වාද කරනු ඇත.

එම්බා පොළව පර්වතය දිය පොකුණක්ද ගිණි ගල දිය උල්පතක්ද කලා වූ" (ගීතාවලිය 114:7

*************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*

ව්‍යාකූලත්වයක් ඇතිකළාක් මෙන් පෙනෙන නමුත් නියම වේලාවේදී දෙවියන් වහන්සේ නියම කළ කාලයට උන්වහන්සේ තම පොරොන්දුව ඔහුගේ ජීවිතවල ඉටු කළ සේක. එබැවින් අධෛර්යමත් නොවන්න. උන්වහන්සේට ඔවුන් වෙනුවෙන් එය කළ හැකිනම්; උන්වහන්සේ ඔබ වෙනුවෙන්ද එය කළ හැකිය. ඔබ සිටින ස්ථානය තුළදීම දෙවියන්වහන්සේ ඔබව දකින අතර ඔබ සවන් දෙයි. ඔබට මේ ලෝකයේ දෘෂ්ටියෙන් සැඟවී සිටිය හැකි නමුත්, ඔබ කිසි විටෙකත් දෙවියන් වහන්සේගේ දෘෂ්ටියෙන් සැඟවී නැත.

දෙවියන්වහන්සේ ඔබගේ සැඟවුණු ස්ථානවලට මුහුණ දෙන්නේ ඔබව හෙළිදරව් කිරීමට නොව, ඔබව බල ගන්වන පිරිසයි. උන්වහන්සේ සාරාගෙන් ඇසූ ප්‍රශ්නයම අද ඔබෙන්ද අසයි.

**"ස්වාමීන්වහන්සේට කිරීමට අපහසු දෙයක් තිබේද?"**

**අද දින, අප අපගේ ඇදහිල්ලෙන් නැවත නැගිටිමු.**

************

## NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd MAY 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**